# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,903 — 1970 අප්‍රේල් 24 වැනි සිකුරාදා — 1970.4.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසයකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 341 | ආදායම හා වියදම පිළිබඳ ප්‍රකාශන ... ... | 345 |
| කනතුරු-ඇබෑර්තු ... ... ... | 342 | අය-වැය ලේඛන ... ... ... | 349 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපළ විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | 344 | විවිධ දැන්වීම ... ... ... ... | 350 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 74/39

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970 අප්‍රේල් 3 දින,
කොළඹ දී ය.

### ආඥාව

1969 ජනවාරි 9 වැනි දින හා අංක 14,835/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ සඳහන් උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිංහලපත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරීගේ කොට්ඨාශයේ සිංහලපත්තු ගම් ප්‍රදේශය, මින්නේරිය, හිරිතලේ සහ මැදිරිගිරිය යන නව ගම් ප්‍රදේශවලට බෙදීමට අදාළ වූ කරුණු ක්‍රියාත්මක කිරීමට මෙහි වූ උපලේඛනයේ සඳහන් පරිදි විධිවිධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි ගම්සභා ආඥාපනතේ සියළුම කාර්‍යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තික සභාව වශයෙන් සැලකිය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1969 ජූනි 30 වැනි දිනට වලංගුව පවත්නා සියළුම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1969 ජූලි 1 දින සිට එකී එක් එක් අළුත් ගම් ප්‍රදේශය තුල වලංගුව පැවතිය යුතු අතර, එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් එම අතුරු ව්‍යවස්ථා සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1969 ජූනි 30 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැරව තිබුණු මුදල් ප්‍රමාණය, 1969 ජූලි මස 1 වැනි දින දී 7 : 3 : 6 අනුපාතයට මින්නේරිය, හිරිතලේ සහ මැදිරිගිරිය යන අළුත් ගම් ප්‍රදේශයන්හි ගම් සභාවන්හී පොදු අරමුදලට වෙන්කර බැර කළ යුතුය.

4. 1969 ජූනි 30 දින දී පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී තිබුණ හෝ එහි පාලනය යටතේ පැවැති එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල, 1969 ජූලි මස 1 දින

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**1968 දෙසැම්බර් මස 14 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්වවූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියාවූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.

(ආ) **කාර්යක්ෂමතා කඩයිම.**—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා '' නව ප්‍රවේශක නිලධාරීහු '' සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධි විධාන බලපවත්වනු ඇත.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරණ කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

**සටහන 1.**—මේ කරුණ සම්බන්ධයෙන් '' නව ප්‍රවේශක නිලධාරි '' යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

**සටහන 2.**—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ '' ආදි ප්‍රවේශක නිලධාරීන් '' කෙරෙහි ඉහත 4 වැනි ඡෙදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදාළ නොවේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා '' ලාංකික '' යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්තවූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡෙදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අවම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පූරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාගන්නට තමන් සූදානම්ව සිටිත්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමෙ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් නැතිවුණොත් නැතිවු නැහැ යන්න සලකා බලනු නොලැබේ. ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

අත්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

## පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු **කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්** වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනුපිණිස, තම අයදුම්පත්‍ර පිළියෙලකිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්වලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළ වන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡෙදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

—————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පූරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය:—————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :—————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :—————.

ජාතිය :—————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :—————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු :—————. මාස :—————, දින :—————

(ආ) උපන් දිනය :—————

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතනය හා කාලසීමාවන් :————

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :—
(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.
(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.

13. **විශෙෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද?:————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස් සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—අගලවත්ත ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 540—30 × 8—24 × 1—රු. 804 රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) වයස : 1970 මැයි මස 24 වැනි දිනට වයස අවුරුදු 20 ට නො අඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම්පත්‍ර, ඔහුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1970 මැයි මස 24 වැනි දිනට හෝ ඊට පළමු අගලවත්ත ගම්සභාවේ සභාපති, වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ජී. ඩී. යසපාල,
අගලවත්ත ගම්සභා සභාපති.

1970 අප්‍රේල් මස 10 වැනි දින,
මීගහතැන්නේ,
අගලවත්ත ගම්සභා කාර්යාලයේ දී ය.

4–803—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත
### (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 66(2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බල මණ්ඩල).

1970 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දීය.

උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | | **කොළඹ දිස්ත්‍රික්කය** |
| | | කඩුවෙල ගම් සභාව |
| 5 | ... | කටුගම්පලගේ දොන් හෙන්ද්‍රික් අප්පුහාමි |
| | | කැරගල ගම් සභාව |
| 12 | ... | ගුණරත්න ආරච්චිගේ දොන් අභයවර්ධන ගුණරත්න |
| | | **කළුතර දිස්ත්‍රික්කය** |
| | | මුන්වත්තබාගේ පත්තු බටහිර ගම් සභාව |
| 12 | ... | ගමලත්ගේ දොන් වෙලින්ටන් ජයසිරි කරුණාතිලක |

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|

**හොරණ නගර සභාව**

7 ... කරඳන ආචාරිගේ පියසේන පෙරේරා

## මහනුවර දිස්ත්‍රික්කය

**කුම්පනේ පල්ලේ පළාත ගම් සභාව**

5 ... දසනායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දසනායක

**පාතදුම්බර පල්ලිස්පත්තු බටහිර ගම් සභාව**

11 ... අබසින් මුදියන්සේලෑ මුදියන්සේ

**හාරිස්පත්තු කුළුගම්මනසියපත්තු ගම් සභාව**

24 ... වෛද්‍යතිලක නවරත්න මුදලිගේ වෙදගෙදර දන්තසිංහ

**උඩපළාත ගඟ පහළ ගම් සභාව**

12 ... ටිකිරි බණ්ඩා දුනුකාර

**මැදදුම්බර මැදසියපත්තු ගම් සභාව**

2 ... ඒකනායක මුදියන්සේලාගේ අස්සැද්දුමේ ගෙදර පුංචි බණ්ඩා

## මාතලේ දිස්ත්‍රික්කය

**ඉනාමළුව කෝරළේ ගම් සභාව**

7 ... මිල්ලගහගෙදර බයියා

## ගාලු දිස්ත්‍රික්කය

**බද්දේගම ගම් සභාව**

10 ... පැල්පොල ලොකු ලියනගේ ධර්මදස අල්විස්

## අම්පාර දිස්ත්‍රික්කය

**කරවාකු දකුණ ගම් සභාව**

8 ... ඊබ්‍රාලෙබ්බෙ උතුමාන්කණ්ඩු

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

**සාම්බල්තිවු ගම් සභාව**

5 ... සෙල්ලයියා සින්නතම්බි

## පුත්තලම දිස්ත්‍රික්කය

**කල්පිටිය ගම් සභාව**

4 ... මොහම්මදු නජිමුදීන් හමීදු

## බදුල්ල දිස්ත්‍රික්කය

**දඹවින්න ගම් සභාව**

5 ... විලේගොඩ ලියනගේ ගුණසේකර

**ඇටම්පිටිය ගම් සභාව**

6 ... තෙන්නකෝන් මුදියන්සේලාගේ කිරිබණ්ඩා

4–808—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## කහවත්ත සුළු නගර සභාව

**1968 වර්ෂයේ ආදායම් හා වියදම් ප්‍රකාශනය**

| | රු. ශ. | රු. ශ |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... | ... 50,901 48 | |
| බී.—වංමාවත් ... | ... 537 70 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | ... 293 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 14,650 41 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 17,036 95 | |
| | | 83,419 54 |
| **වෙනත් ලැබීම්** | | |
| තැන්පත් ... | ... 18,898 96 | |
| අත්තිකාරම් ... | ... 3,952 67 | |
| ණය මුදල් (විදුලිය) ... | ... 29,500 0 | |
| විදුලිය ගිණුම ... | ... 402 25 | |
| | | 52,753 88 |
| **ආදායම් එකතු කිරීමේ ගිණුම** | | |
| 1. දේපල බදු ... | ... 9,670 36 | |
| 2. වර්වස් ශෝධන බදු ... | ... 6,349 05 | |
| 3. කුලී... ... | ... 5,562 50 | |
| 4. වතුර කරාම ගාස්තු ... | ... 312 0 | |
| 5. වරෙන්තු ගාස්තු ... | ... 410 91 | |
| 6. විවිධ ණය ගැතියෝ ... | ... 4,762 54 | |
| | | 27,067 36 |
| විවිධ ණය හිමියෝ ... | ... | 13,258 37 |
| අතිරික්තය සාමාන්‍යය | ... | 1,880 86 |
| 1967.12.31 වන දිනට ඉතිරිය | ... | 72,551 15 |
| | එකතුව ... | 2,50,931 16 |

| | රු. ශ. | රු. ශ |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... | ... 32,489 08 | |
| බී.—වංමාවත් ... | ... 1,494 0 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | ... 1,766 23 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 29,623 69 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 2,243 0 | |
| | | 67,616 0 |
| **වෙනත් ගෙවීම්** | | |
| තැන්පත් ... ... | ... 2,331 94 | |
| අත්තිකාරම් ... | ... 7,508 89 | |
| **රජයේ ආධාර** | | |
| මුඩුක්කු සංහාරක නිවාස යෝජනා ක්‍රමය | ... 10,061 75 | |
| ක්‍රීඩා භූමිය ... | ... 185 0 | |
| පන්සල පාර ... | ... 1,770 54 | |
| රවුම් පාර ... | ... 3,696 02 | |
| ණය මුදල්—විදුලිය ... | ... 26,596 50 | |
| විදුලිය ගිණුම ... | ... 2,458 46 | |
| | | 54,609 10 |
| **ආදායම් එකතු කිරීමේ ගිණුම** | | |
| 1. දේපල බදු ... | ... 10,351 40 | |
| 2. වර්වස් ශෝධන බදු ... | ... 6,900 91 | |
| 3. කුලී ... ... | ... 5,562 50 | |
| 4. වතුර කරාම ගාස්තු ... | ... 634 0 | |
| 5. වරෙන්තු ගාස්තු ... | ... 558 55 | |
| 6. විවිධ ණය ගැතියෝ ... | ... 5,931 92 | |
| | | 29,939 28 |
| විවිධ ණය හිමියෝ ... | ... | 6,854 75 |
| ස්ථිර තැන්පත් ... | ... | 20,000 0 |
| 68.12.31 වන දිනට ශේෂය | ... | 71,912 03 |
| | එකතුව ... | 2,50,931 16 |

කහවත්ත සුළු නගර සභාවේ සභාපති සැල්පින්සිංඤෝ බුලත්සිංහල වන මම ඉහත සඳහන් ප්‍රකාශනය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වන වර්ෂය පිළිබඳව කහවත්ත සුළු නගර සභාවේ ආදායම් සහ වියදම් පිළිබඳ වූ නිවැරදි හා සත්‍ය ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ඇස්. බුලත්සිංහල,
සභාපති,
කහවත්ත සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරන ලදී.

ඩී. ඇස්. අබේනායක,
අංක 4 දරණ කොට්ඨාශයේ සභික.

1969 ඔක්තෝබර් මස 27 වන දින මා ඉදිරිපිටදී කහවත්තේදී සහතික කරන ලදී.

රාජපක්ෂ සේනාධිර ආරච්චිගේ බාරොන් පෙරේරා,
සමාදාන විනිශ්චයකාර තැන.

**1968 දෙසැම්බර් මස 31 වැනි දිනට කහවත්ත සුළු නගර සභාවේ වත්කම් සහ බැරකම් දක්වන ප්‍රකාශයයි**

**බැරකම්**

| | රු. ශ. | රු. ශ | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් ... ... ... | | | 21,347 12 |
| **රජයේ ආධාර** | | | |
| මුඩුක්කු සංහාරක නිවාස යෝජනා ක්‍රමය ... | | 29,840 75 | |
| කහවත්ත ක්‍රීඩා භූමිය වැඩි දියුණු කිරීම ... | | 1 55 | |
| කහවත්ත රවුම් පාර දියුණු කිරීම ... | | 579 57 | |
| කහවත්ත පන්සල පාර දියුණු කිරීම ... | | 496 60 | |
| | | | 30,918 47 |
| විවිධ ණය හිමියෝ ... ... | | | 13,258 37 |
| විදුලි යෝජනා ක්‍රමය (ණය මුදල්) ... | | | 2,903 50 |
| **අතිරික්තය හා ඌනතා ගිණුම (සාමාන්‍ය)** | | | |
| පෙර වස ශේෂය ... ... | | 46,193 33 | |
| මෙම වස වැඩිවීම ... | රු. ශ. | 1,880 86 | |
| 68.12.31 දිනට අය ... | 83,419 54 | | |
| 68.12.31 දිනට වැය ... | 67,616 0 | | |
| 68.12.31 දිනට ශේෂය | | 15,803 54 | |
| | | | 63,877 73 |
| | | | 1,32,305 19 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... ... | | | 5,782 57 |
| දේපල බදු ... ... ... | | | 11,897 96 |
| වර්චස් ශෝධන බදු ... ... | | | 7,33ǀ 68 |
| වතුර කරාම ගාස්තු ... ... | | | ɜ22 0 |
| විවිධ ණය ගැතියෝ ... ... | | | 6,514 42 |
| වරිපණම් දඩ මුදල් ... ... | | | 2,467 57 |
| කශළ අකුගැමේ ගාස්තු ... ... | | | 1,1ɜ7 50 |
| ස්ථිර තැන්පත් ... ... | | | 20,0ɔ0 0 |
| **අතිරික්තය හා ඌනතා ගිණුම (විදුලිය)** | | | |
| 67.12.31 දිනට ඌනතාවය ... | | 2,880 25 | |
| 68.12.31 දිනට වැය ... | 2,458 46 | | |
| 68.12.31 දිනට අය ... | 4 ,2 25 | | |
| | | 2,056 21 | |
| | | | 4,936 46 |
| 1968.12.31 වන දිනට ඉතිරි මුදල් | | | 71,912 03 |
| | | | 1,32,3ɔ5 19 |

කහවත්ත සුළු නගර සභාවේ සභාපති සැල්පින්සිංඤෝ බුලත්සිංහල වන මම ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් 31 වැනි දිනට කහවත්ත සුළු නගර සභාවේ වත්කම් සහ බැරකම් පිළිබඳව නිවැරදි හා සත්‍ය ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ඇස්. බුලත්සිංහල,
සභාපති,
කහවත්ත සුළු නගර සභාව.

නිවැරදි [illegible] සහතික කරන ලදී.
ඩී. ඇස්. අබේනායක,
අංක 4 දරණ කොට්ඨාශයේ සභික.

1969 ඔක්තෝබර් මස 27 වැනි දින මා ඉදිරිපිටදී කහවත්තේදී සහතික කරන ලදී.

රාජපක්ෂ සේනාධිර ආරච්චිගේ බාරොන් පෙරේරා,
සමාදාන විනිශ්චයකාර තැන.

4–820—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## වාද්දුව උප නගර සභාව

**1968 වර්ෂයේ ආදයම් හා වියදම් ප්‍රකාශය**

**ආදයම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| ඒ. සාමාන්‍ය ආදයම ... ... | | | 1,69,878 03 |
| බී. මහා මාර්ග ... ... ... | | | 3,324 40 |
| සී. නගර සභා ගොඩනැගිලි සහ ඉඩම් ... | | | 4,898 96 |
| ඩී. සනීපාරක්ෂාව ... ... ... | | | 3,897 0 |
| ඊ. මහජන විනෝදය ... ... | | | 6,884 35 |
| එෆ්. සොහොන් බිම් ... ... | | | 800 50 |
| ජී. බල්ලන් ලියා පදිංචි කිරීම ... ... | | | 20 50 |
| ජේ. කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | | | — |
| | | | 1,89,703 74 |
| **වෙනත් ලැබීම්** | | | |
| තැන්පත් සාමාන්‍ය හා විදුලිය ... | | 28,141 40 | |
| රජයේ ආධාර :— | | | |
| ක්‍රීඩා භූමි ... | 5,000 0 | | |
| පුස්තකාල ... | 700 0 | | |
| මැද පාර ... | 5,500 0 | | |
| | | 11,200 0 | |
| | | | 39,341 40 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම** | | | |
| දේපල බදු ... | | 51,740 14 | |
| කසල බදු ... | | 7,628 45 | |
| කුලී ... ... | | 7,134 32 | |
| වරෙන්තු ගාස්තු ... | | 917 98 | |
| විදුලිය ගාස්තු ... | | 1,05,236 80 | |
| | | | 1,72,657 69 |
| අත්තිකාරම් ... ... ... | | | 8,520 52 |
| අධිකතා හා ඌනතා ගිණුම ... ... | | | 52 75 |
| ක්ෂය සඳහා සංචිතය ... ... ... | | | 1,000 0 |
| විදුලිය ගිණුම ... ... ... | | | 1,53,303 83 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | | | 18,947 03 |
| විවිධ ණය හිමියෝ ... ... ... | | | 1,00,084 98 |
| 1967.12.31 දිනට මුදල් ශේෂය ... ... | | | 69,879 31 |
| | | | 7,53,491 25 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| ඒ. සාමාන්‍ය වියදම ... ... ... | | | 50,663 81 |
| බී. මහා මාර්ග ... ... ... | | | 41,103 81 |
| සී. නගර සභා ගොඩනැගිලි සහ ඉඩම් ... | | | 10,114 55 |
| ඩී. සනීපාරක්ෂාව ... ... ... | | | 85,289 03 |
| ඊ. මහජන විනෝදය ... ... | | | 614 0 |
| එෆ්. සොහොන් බිම් ... ... ... | | | 1,840 50 |
| ජී. බල්ලන් ලියා පදිංචි කිරීම ... ... | | | — |
| ජේ. කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | | | 2,802 78 |
| | | | 1,92,428 48 |
| **වෙනත් ගෙවීම්** | | | |
| තැන්පත් සාමාන්‍ය හා විදුලිය ... | | 19,508 03 | |
| රජයේ ආධාර :— | | | |
| ක්‍රීඩා භූමි ... | 6,001 50 | | |
| පුස්තකාල ... | 339 35 | | |
| වෙරළ පාර ... | 218 0 | | |
| දළදවත්ත පටුමග ... | 648 0 | | |
| තිස්ස පාර ... | 1,333 80 | | |
| මැද පාර ... ... | 1,485 0 | | |
| | | 10,025 65 | |
| | | | 29,533 68 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම** | | | |
| දේපල බදු ... ... | | 59,217 08 | |
| කසල බදු ... ... | | — | |
| කුලී ... ... | | 7,646 50 | |
| වරෙන්තු ගාස්තු ... | | 240 60 | |
| විදුලිය ගාස්තු ... | | 1,12,090 55 | |
| | | | 1,79,194 73 |
| අත්තිකාරම් ... ... ... | | | 6,352 75 |
| අධිකතා හා ඌනතා ගිණුම ... ... | | | 8 50 |
| ක්ෂය සඳහා සංචිතය ... ... ... | | | 8,687 30 |
| විදුලිය ගිණුම ... ... ... | | | 1,39,211 66 |
| ස්ථාවර තැන්පත් ... ... ... | | | 526 57 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | | | 25,653 66 |
| විවිධ ණය හිමියෝ ... ... ... | | | 1,11,232 29 |
| 1968.12.31 දිනට මුදල් ශේෂය ... ... | | | 60,661 63 |
| | | | 7,53,491 25 |

වාද්දුව උප නගර සභාවේ සභාපතිනි, කඩිගමුව කෝරාලලාගේ ප්‍රේමලීලා ශ්‍රියාලතා විජේරත්න වන මම, ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් 31 වෙනි දිනට වාද්දුව උප නගර සභාවේ ආදයම් හා වියදම් පිළිබඳව සත්‍යවූත්, නිවැරදිවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ප්‍රේමලීලා විජේරත්න,
සභාපතිනි,
වාද්දුව උප නගර සභාව.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

වයි. ට්ඩිමන් සිල්වා,
අංක 1 කොට්ඨාශයේ නියෝජිත,
වාද්දුව උප නගර සභාව.

1969 දෙසැම්බර් මස 14 වැනි දින වාද්දුවේ දී මා ඉදිරිපිට අත්සන් කර ප්‍රකාශකර බවට.

එච්. ඒ. පී. විජේසේකර,
සාමදාන විනිශ්චයකාර.

1969 දෙසැම්බර් මස 14 වැනි දින,
වාද්දුව උප නගර සභා කාර්යාලයේ දීය.

## වාද්දුව උප නගර සභාව

### 1968.12.31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| **තැන්පත්** | | | | |
| සේවක ඇප ... | | 2,000 0 | | |
| සාමාන්‍ය ... | | 14,450 32 | | |
| විදුලිය ... | | 30,489 32 | | |
| | | | 46,939 64 | |
| **රජයේ ආධාර** | | | | |
| නිවාස යෝජනා ක්‍රමය ... | | 492 66 | | |
| ක්‍රීඩා භූමි ... | | 4,945 0 | | |
| ප්‍රජා මණ්ඩල ... | | 8 50 | | |
| වෙරළ පාර ... | | 130 0 | | |
| දළදවත්ත පාර ... | | 154 73 | | |
| මැද පාර ... | | 27 0 | | |
| දළදවත්ත පටුමඟ ... | | 1,728 50 | | |
| තිස්ස පාර ... | | 2,516 70 | | |
| පුස්තකාල ... | | 2,070 15 | | |
| වෙරළ පාර ... | | 2,581 48 | | |
| මැද පාර ... | | 4,015 0 | | |
| | | | 18,669 72 | |
| | | | | 65,609 36 |
| **ණය මුදල් ඉතිරි** | | | | |
| නිවාස යෝජනා ක්‍රමය ... | | 9,330 76 | | |
| විදුලි යෝජනා ක්‍රමය ... | | 2,516 07 | | |
| ට්‍රැක්ටරය මිලයට ගැනීම ... | | 2,367 75 | | |
| | | | | 14,214 58 |
| **ක්ෂය සඳහා සංචිතය** | | | | |
| 1968.1.1 දිනට ඉතිරි ... | | 20,300 0 | | |
| 1968 වර්ෂයේ එකතු කිරීම ... | | 1,000 0 | | |
| | | 21,300 0 | | |
| 1968 වර්ෂයේ වියදම් කිරීම ... | | 8,687 30 | | |
| | | | | 12,612 70 |
| විවිධ ණය හිමියෝ ... | | | | 1,44,640 06 |
| අධිකතා හා ඌනතා ගිණුම (විදුලිය) | | | | |
| 1968.1.1 දිනට අතිරික්තය ... | | 12,127 59 | | |
| 1968 වර්ෂයේ සකස් කිරීම ... | | 8 50 | | |
| | | 12,119 09 | | |
| 1968 වර්ෂයේ අය | 1,53,303 83 | | | |
| 1968 වර්ෂයේ වැය | 1,39,211 66 | | | |
| | | 14,092 17 | | |
| | | | | 26,211 26 |
| | | | | 2,63,287 96 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| **හිඟ ආදයම්** | | | |
| දේපල බදු හිඟ ... | | 46,493 30 | |
| කුලී හිඟ ... ... | | 1,741 0 | |
| කසල බදු හිඟ ... | | 5,354 18 | |
| වරෙන්තු ගාස්තු හිඟ ... | | 1,550 54 | |
| විදුලිය ගාස්තු හිඟ ... | | 29,470 87 | |
| | | | 84,609 89 |
| අත්තිකාරම් ... ... | | | 2,148 07 |
| විවිධ ණය ගැතියෝ ... | | | 33,220 96 |
| **ස්ථිර තැන්පත්** | | | |
| ලංකා සේවිංස් බැංකුවේ ... | | 15,574 54 | |
| සේවක ඇප—තැපැල් කන්තෝරු ඉතිරිකිරීමේ බැංකුවේ ... | | 2,000 0 | |
| | | | 17,574 54 |
| අධිකතා හා ඌනතා ගිණුම (සාමාන්‍ය) | | | |
| 1968.1.1 දිනට ඌනතාවය ... | | 62,400 88 | |
| 1968 වර්ෂයේ සකස් කිරීම් ... | | 52 75 | |
| | | 62,348 13 | |
| 1968 වර්ෂයේ වැය ... | 1,92,428 48 | | |
| 1968 වර්ෂයේ අය ... | 1,89,703 74 | | |
| | | 2,724 74 | |
| | | | 65,072 87 |
| මුදල් ඉතිරිය ... | | | 60,661 63 |
| | | | 2,63,287 96 |

වාද්දුව උප නගර සභාවේ සභාපතිනි, කඩිගමුව කෝරාලලාගේ ප්‍රේමලීලා ශ්‍රියාලතා විජේරත්න වන මම, ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් මස 31 වෙනි දිනට වාද්දුව උප නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳව සත්‍යවූත්, නිවැරදිවූත්, ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ප්‍රේමලීලා විජේරත්න,
සභාපතිනිය,
වාද්දුව උප නගර සභාව.

ඉහත සඳහන් ප්‍රකාශ නිවැරදි බවට සහතික කරමි.

වයි. ට්ඩිමන් සිල්වා,
අංක 1 කොට්ඨාශයේ නියෝජිත,
වාද්දුව උප නගර සභාව.

1969 දෙසැම්බර් මස 14 වැනි දින වාද්දුවේ දී මා ඉදිරිපිට අත්සන් කර ප්‍රකාශකර බවට.

එච්. ඒ. පී. විජේසේකර,
සාමදාන විනිශ්චයකාර.

1969 දෙසැම්බර් මස 14 වැනි දින,
වාද්දුව උප නගර සභා කාර්යාලයේ දීය.

4-817—70.4.24 දින අංක 14,903 දරන හැසට් පත්‍රය

## වලස්මුල්ල සුළු නගර සභාව

**1968 වර්ෂයේ ආදයම් හා වියදම් ප්‍රකාශය**

| ආදයම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම ... ... | | 34,533 03 |
| බී.—මංමාවත් ... ... | | 1,687 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | | — |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... | | 20,425 90 |
| ඊ.—මහජන විනෝදය ... ... | | 3,469 90 |
| එෆ්.—සුසාන භූමි ... ... | | — |
| ජී.—සුනඛ ලියාපදිංචිය ... ... | | 1 0 |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | | — |
| අයි.—ගින්නෙන් ආරක්ෂා කිරීම ... | | — |
| | | 60,116 83 |
| **වෙනත් ලැබීම්** | | |
| තැන්පත් ... ... | 7,603 74 | |
| රජයේ ආධාර ... ... | — | |
| | | 7,603 74 |
| අත්තිකාරම් ... ... | | 3,343 45 |
| ආදයම් එකතු කිරීමේ ගිනුම්— | | |
| දේපල බදු ... ... | 4,976 22 | |
| මාකට් බදු කුලී ... ... | 18,671 50 | |
| වරිපනම් දඩ ... ... | 203 49 | |
| | | 23,851 21 |
| විවිධ ණය හිමියෝ ... ... | | 8,726 95 |
| විවිධ ණය ගැතියෝ ... ... | | 4,258 21 |
| අධිකතා හා ඌනතා ගිනුම ... ... | | 836 16 |
| 1967.12.31 දිනට මුදල් ශේෂය ... | | 47,165 32 |
| | | 1,55,901 87 |

| වියදම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | | 23,314 42 |
| බී.—මංමාවත් ... ... | | 2,908 20 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... | | 2,100 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... | | 21,871 99 |
| ඊ.—මහජන විනෝදය ... ... | | 722 50 |
| එෆ්.—සුසාන භූමි ... ... | | — |
| ජී.—සුනඛ ලියාපදිංචිය ... ... | | — |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | | — |
| අයි.—ගින්නෙන් ආරක්ෂා කිරීම ... | | 62 70 |
| | | 50,979 81 |
| **වෙනත් ගෙවීම්** | | |
| තැන්පත් ... ... | 5,585 51 | |
| රජයේ ආධාර ... ... | 7,382 05 | |
| | | 12,967 56 |
| අත්තිකාරම් ... ... | | 2,329 38 |
| ආදයම් එකතු කිරීමේ ගිනුම්— | | |
| දේපල බදු ... ... | 8,209 74 | |
| මාකට් බදු කුලී ... ... | 18,622 0 | |
| වරිපනම් දඩ ... ... | 489 84 | |
| | | 27,321 58 |
| විවිධ ණය හිමියෝ ... ... | | 2,528 66 |
| විවිධ ණය ගැතියෝ ... ... | | 5,535 42 |
| අධිකතා හා ඌනතා ගිනුම ... | | 156 84 |
| 1968.12.31 දිනට මුදල් ශේෂය ... | | 54,082 62 |
| | | 1,55,901 87 |

වලස්මුල්ල සුලු නගර සභාවේ, සභාපති, දුමිංගු හේවාගේ ජිනදස විජේසූරිය වන මම, ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් 31 වැනි දිනට වලස්මුල්ල සුලු නගර සභාවේ ආදයම් හා වියදම් පිලිබඳ සත්‍ය වූත් නිවැරදිවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතිකකරමි.

ඩී. එච්. ජේ. විජේසූරිය,
සභාපති,
සුලු නගර සභාව—වලස්මුල්ල.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

කේ. එච්. ජී. ද සිල්වා,
අංක 5 කොට්ඨාශයේ නියෝජිත,
සුලු නගර සභාව—වලස්මුල්ල.

1969 නොවැම්බර් මස 20 වෙනි දින වලස්මුල්ලේ දී මා ඉදිරිපිටදී අත්සන් කර දිවුරුම් දුන් බවට සහතික කරමි.

පී. අයි. ආර්. රත්නතුංග,
සමාදාන විනිශ්චයකාර.

1969 නොවැම්බර් මස 20 වැනි දින
වලස්මුල්ල සුලු නගර සභා කාර්‍යාලය,
වලස්මුල්ල

## වලස්මුල්ල සුළු නගර සභාව

**1968.12.31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය**

| බැරකම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් (සාමාන්‍ය) ... ... ... | | 6,362 04 | |
| රජයේ ආධාර :— | | | |
| ක්‍රීඩා පිටිය ... ... ... | 3,000 0 | | |
| පුස්ථකාලය ... ... ... | 4,050 0 | | |
| ප්‍රජාමණ්ඩලය ... ... ... | 375 0 | | |
| නකුවල–පද්දපිටිය පාර ... ... | 799 0 | | |
| කොහොලාන පාර ... ... ... | 806 44 | | |
| | | 9,030 44 | 15,392 48 |
| විවිධ ණය හිමියෝ ... ... ... | | | 14,712 87 |
| අධිකතා හා ඌණතා ගිනුම (සාමාන්‍ය) | | | |
| 1968.1.1 දිනට අතිරික්තය ... ... | | 50,840 21 | |
| සකස් කිරීම—එකතු කලා ... ... | | 836 16 | |
| | | 51,676 37 | |
| සකස් කිරීම් අඩුකලා ... ... | | 156 84 | |
| | | 51,519 53 | |
| 1968 වර්ෂයේ ආදයම් ... ... ... | 60,116 83 | | |
| 1968 වර්ෂයේ වියදම් ... ... ... | 50,979 81 | | |
| | | 9,137 02 | 60,656 55 |
| | | | 90,761 90 |

| වත්කම් | රු. ශ. |
|---|---|
| දේපල බදු හිඟ ... | 21,414 51 |
| කුලී හිඟ ... ... | 3,619 28 |
| වරෙන්තු ගාස්තු හිඟ ... | 1,691 92 |
| අත්තිකාරම් ... | 4,398 15 |
| විවිධ ණය ගැතියෝ ... | 5,555 42 |
| මුදල් ඉතිරිය ... | 54,082 62 |
| | 90,761 90 |

වලස්මුල්ල සුළු නගර සභාවේ සභාපති දුමිංගු හේවාගේ ජිනදස විජේසූරිය වන මම, ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් 31 වැනි දිනට වලස්මුල්ල සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳව සත්‍යවූත් නිවැරදිවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ඩී. එච්. ජේ. විජේසූරිය,
සභාපති.
සුළු නගර සභාව—වලස්මුල්ල,

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

කේ. එච්. ජී. ද සිල්වා,
අංක 5 කොට්ඨාශයේ නියෝජිත,
සුළු නගර සභාව—වලස්මුල්ල.

1969 නොවැම්බර් මස 20 වෙනි දින වලස්මුල්ලේ දී මා ඉදිරිපිට අත්සන් කර දිවුරුම් දුන් බවට සහතික කරමි.

1969 නොවැම්බර් මස 20 වැනි දින,
වලස්මුල්ල සුළු නගර සභා කාර්‍යාලය,
වලස්මුල්ල.

පී. අයි. ආර්. රත්නතුංග,
සමාදාන විනිශ්චයකාර.

4-811—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## පෑලියගොඩ නගර සභාව

**1970 වර්ෂයේ පළමුවැනි පරිපූරක අය-වැය ලේඛනය**

| වැය ශීර්ෂ සහ උප ශීර්ෂ | මුදල රු. | ශ. | යෝජනා අංකය |
|---|---|---|---|
| බී.—මාර්ග :— | | | |
| (2) නඩත්තුව ... | 7,989 | 0 ... | 1970.2.15 දින 19 (23ඒ) |
| (8) වැඩිදියුණු සඳහා ... | 1,675 | 0 ... | එම |
| ඩී.—පළාත් ආණ්ඩු සභාවට අයත් බිම් සහ ගොඩනැගිලි වලින් | | | |
| (7) අභිනව වැඩට ... | 21,000 | 0 ... | 1970.2.15 දින 13 |
| | 30,664 | 0 | |

වින්සන්ට් රාජපක්ෂ,
සභාපති,
පෑලියගොඩ නගර සභාව

1970 අප්‍රේල් මස 8 වැනි දින,
පෑලියගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

4-816—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## පොලොන්නරුව සුළු නගර සභාව

**1970 අය-වැය ලේඛණය—1 කොටස (සාමාන්‍ය)**

| වියදම් ශීර්ෂය | ගණන් බලන ලද වියදම රු. | ශ. |
|---|---|---|
| ඒ.—5 දිළිඳු ශිෂ්‍යයින්ට පාසල් පොත් සැපයීම ... | 1,500 | 0 |
| | 1,500 | 0 |

1970 පෙබරවාරි මස 26 වෙනි දින මාසික රැස්වීමේ අංක 9 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

පී. ඇල්. බෞද්ධසාර,
සභාපති,
පොළොන්නරුව සුලු නගර සභාව.

1970 ක්වූ අප්‍රේල් මස 8 වෙනි දින,
පොළොන්නරුව සුලු නගර සභා කාර්‍යාලයේ දී ය.

4-819—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## බෙන්තොට සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (II) යටතේ කෙරෙන අයදුම් පත**

1970 අය–වැය ලේඛනය

1970 අය-වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතුරුවේයයි ගණන් බලන ලද පහත දැක්වෙන වැය ශීර්ෂ යටතේ ඇති මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂ වලට මාරුකර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1970 ජනවාරි මස 28 වෙනි දින පවත්වන ලද සාමාන්‍ය මාසික රැස්වීමේදී අංක 2 (vii) දරණ යෝජනාවෙන් සභා සම්මත කර ගන්නා ලදී.

**මුදල් ඉතිරි වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| (ජී) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... ... | 7,166 | 0 |
| (එච්) අතුරු දීමනා ... ... ... | 1,860 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (12) අළුත් වැඩ ... ... ... | 547 | 0 |
| (13) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... ... | 5,630 | 0 |
| (14) අතුරු දීමනා ... ... ... | 2,520 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| (8) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... ... | 1,078 | 0 |
| (10) අතුරු දීමනා ... ... ... | 500 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය :— | | |
| (2) කැළි කසළ— | | |
| (ඊ) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... | 2,777 | 0 |
| (ඇෆ්) අතුරු දීමනා ... ... | 1,260 | 0 |
| ඩී (5) ජලය සැපයීම— | | |
| (එච්) පොදු නාන ස්ථාන ... ... | 850 | 0 |
| ජේ.—කියවීම්ශාලා සහ පුස්තකාල :— | | |
| (6) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... ... | 979 | 0 |
| (8) අතුරු දීමනා ... ... ... | 420 | 0 |
| | 25,587 | 0 |

**මුදල් අවශ්‍ය වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| (1) නිලධාරි වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 2,216 | 0 |
| (බී) ලිපිකරුවෝ ... ... ... | 4,215 | 0 |
| (සී) ආදායම් පරීක්ෂක ... ... | 1,025 | 0 |
| (ඩී) කා. කා. සහායක ... ... | 1,775 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) වැටුප්— | | |
| (සී) කුලීකරුවෝ ... ... ... | 5,966 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| (1) වැටුප් මුරකරු ... ... ... | 1,315 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය :— | | |
| (2) කැළි කසළ— | | |
| (ඒ) වැටුප්—කුලීකරුවෝ ... ... | 6,905 | 0 |
| ඩී (2) (බී) ගොන් කරත්ත, ලොරි ... ... | 500 | 0 |
| ජේ.—කියවීම්ශාලා සහ පුස්තකාල :— | | |
| (1) වැටුප්—පුස්තකාල සහායක ... ... | 1,670 | 0 |
| | 25,587 | 0 |

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

වර්ෂ 1970 ක්වූ මාර්තු 28 වෙනි දින,
බෙන්තොට සුළු නගර සභා කාර්යාලයේ දී ය.

අනුමත කරමි.

පර්සි, අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල.

වර්ෂ 1970 ක්වූ අප්‍රේල් මස 7 වෙනි දින,
ගාල්ලේ පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

4-810—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### 1970 වර්ෂයේ වරිපණම් ලේඛණය

පරිච්ඡේද අංක 255 දරණ පළාත් ආණ්ඩු සහ ආඥපනතේ 166 වෙනි ඡේදයෙන් කියවෙන පරිදි, පරිච්ඡේද අංක. 252 දරණ නාගරික සභා ආඥපනතේ 235 (1) වැනි ඡේදය අනුව, අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ (සීමා පුළුල් කිරීමට පෙර තිබූ ප්‍රදේශය) 1970 වර්ෂය සම්බන්ධව වරිපණම් ලේඛනය පරීක්ෂා කිරීම සඳහා කාර්යාල වේලාවන් තුළදී මෙම පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදී විවෘතව ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආනන්ද සෝමවීර,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
අවිස්සාවේල්ල, 1970.4.9 දින.

4–804—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## පුස්සැල්ලාව සුළු නගර සභාව

### ජලභීතිකා රෝගය

පුස්සැල්ලාව සුළු නගර සභා සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නා වූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන හෝ දඬුවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පතෙහි පලවන දින සිට ඉදිරියට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

පී. පලනිසාමි,
සභාපති,
පුස්සැල්ලාව සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
පුස්සැල්ලාව. 1970.3.31.

4–813—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන අයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත

පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ කැකනදුර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ:—

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953.4.10 දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද උත්තර මන්ත්‍රීමණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රීමණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953.8.7 දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශ කරනලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 18, 19, 21 හා 22 යන කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට කැකනදුර ගම්සභාව විසින් පළාත් පාලන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

පියසේන දහනායක,
කැකනදුර ගම්සභාපති තැන.

1970.3.3 වැනි දින,
කැකනදුර ගම්සභා කාර්යාලයේදීය.

4–806—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳු පළාත ගම්සභාව

### ගෝ ඝාතක ආඥපනත (272 වැනි අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය වන) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධරයා වන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳු පළාත ගම්සභාවේ සභාපති උදුමා ලෙබ්බේ නූර් මොහමඩ් වන මම, 1970 වර්ෂයේදී මෙම පහත දක්වෙන උප ලේඛනයෙහි සඳහන් දිනයන්හි උඩුනුවර කඳු පළාත ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

1970 ජනවාරි 1, 14, 22.
1970 පෙබරවාරි 4, 21.
1970 මාර්තු 22.
1970 අප්‍රේල 21.
1970 මැයි 20, 21.
1970 ජූනි 19, 20.
1970 ජූලි 18.
1970 අගෝස්තු 16.
1970 සැප්තැම්බර් 15, 17.
1970 ඔක්තෝබර් 4, 14.
1970 නොවැම්බර් 13.
1970 දෙසැම්බර් 12.

යූ. එල්. නූර් මොහමඩ්,
උඩුනුවර කඳු පළාත ගම්සභාවේ
සභාපති.

1970 අප්‍රේල් මස 11 වැනි දින,
වෙලම්බොඩ, උඩුනුවර කඳු පළාත ගම්සභා
කාර්යාලයේදීය.

4–807—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## මාතලේ දිස්ත්‍රික්කය—මාතලේ මැදසියපත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛණයෙහි දක්වෙන අය එම උපලේඛණයෙහි දක්වෙන අයුරු සඳහන් ස්ථානයෙහි 1970 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යෑම සඳහා බලපත්‍ර ඉල්ලා ඇති බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මාතලේ මැදසියපත්තු ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යනවග ඇතුලත් ලියවිල්ලක්, පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14ක් ඇතුලත ලියා එවීමට බලය තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ සවභාවය | ස්ථානය |
|---|---|---|
| ඇස්. අබ්දුල් සමුදු ... | හරක් මස් ... | අංක 3 කාමරය, ප්‍රසිද්ධ වෙළඳපොල, උකුවෙල |

යූ. ඇල්. ඒ. මජීඩ්,
ගම් සභාපති.

ගම්සභා කාර්යාලය,
උකුවෙල.
1970 අප්‍රියෙල් මස 8 වැනි දින,

4–822—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරන ප්‍රාදේශීය බල මණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

(261 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලේපත්තුවේ ඕඩ්ඩමාවඩි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර පළකර සිටිනු ලැබේ:—

### යෝජනාව

(261 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලේපත්තුවේ ඕඩ්ඩමාවඩි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි සම්මත කරගනු ලැබේ.

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක: 10,560 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාව 37 වැනි කාණ්ඩය සහ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1956 ජනවාරි 8 වැනි දින අංක 14,287 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා වල 38 වැනි කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළකරවන දිනයේ සිට සම්මතකර ගැනීමට කෝරලේ පත්තුවේ ඕඩ්ඩමාවඩි ගම් සභාව විසින් පළාත්පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 39, 40, 41 වැනි කාණ්ඩවල 8.7.66 හා අංක 14,703 වැනි, දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති පරිදි හා 1969.1.3 වැනි දින අංක 14,835 දරණ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ යෝජනා, ගැසට් පත්‍රයේ පළකර වන දිනයේ සිට සම්මත කරගැනීමට මෙයින් යෝජනා කරනු ලැබේ.

ඉු. මොහමඩ් ෂෙරීප්,
ඕඩ්ඩමාවඩි ගම්සභාවේ සභාපති.

4–821—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1970

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | ... | 70. 4. 3 සිකුරාද | ... | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | | 70. 4.10 සිකුරාද | ... | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 4.17 සිකුරාද | .. | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | | 70. 4.24 සිකුරාද | .. | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 4.30 බ්‍රහස්පතින්ද | .. | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | .. | 70. 5. 8 සිකුරාද | ... | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 5.15 සිකුරාද | .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 5.22 සිකුරාද | ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 5.29 සිකුරාද | ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.